# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIX — YEAR OF OUR LORD JESUS CHRIST, 2025 AUGUST — Issue No. 09


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 37:1-8)**

01. නපුරකරන්නන් නිසා කල නොකිරෙව, අධර්මිෂ්ඨකම් කරන්නන්ට ඊර්ෂ්‍යා නොකරව.

02. මක්නිසාද ඔව්හු තෘණ මෙන් වහාම කපනු ලබන්නෝය, නිල් පලා මෙන් වියළෙන්නෝය.

03. ස්වාමින් කෙරෙහි විශ්වාසය තබා යහපත්කම් කරව; දේශයෙහි වාසයකරමින් විශ්වාසකම අනුව යව.

04. ස්වාමීන්, කෙරෙහි ප්‍රීතිමත්වෙව; උන්වහන්සේද ඔබගේ සිතෙහි ආශාවන් ඉෂ්ටකරනසේක.

05. ඔබගේ මාර්ගය ස්වාමීන්ට භාරදෙව; උන්වහන්සේ කෙරෙහි විශ්වාසයද තබව, උන්වහන්සේ එය ඉෂ්ටකරනසේක.

06. උන්වහන්සේ ඔබගේ ධර්මිෂ්ඨකම එළිය මෙන්ද ඔබගේ යුක්තිය මද්දහන මෙන්ද නික්මවනසේක.

07. ස්වාමීන් 37:7 හෙවත්, ස්වාමීන් තුළ නිශ්චලව සිට. කෙරෙහි රඳා, ඉවසිල්ලෙන් උන්වහන්සේ බලා සිටුව. තමාගේ මාර්ගයෙහි දියුණුවන්නාද නපුරු ප්‍රයෝග ඉෂ්ටකරගන්නාද නිසා කල නොකිරෙව.

08. තරහෙන් වැලකී උදහස අත්හරුව. කල නොකිරෙව, එයින් හටගන්නේ නපුරු ක්‍රියා පමණක්ය.
තරහෙන් වැලකී උදහස අත්හරුව. කල නොකිරෙව, එයින් හටගන්නේ නපුරු ක්‍රියා පමණක්ය.

# ඔබව ඵල දරන පිණිස තෝරාගෙන ඇත.

**FREEDOM TO BEAR FRUIT !**

(සහෝදරී ඒන්ජල්)



කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ සාමාජිකයිනි,

ඔබ සැම දෙනාටම අප සුභ පතන අතර අපගේ දේශයේ 75වන නිදහස් සැමරුම් උත්සවය පැවැත්වීමට හැකිවූ නිසාද ස්තුතිවන්ත වෙමු.

මේ නිදහස් සැමරුම් දිනයේ දී අප අපගේ දේශය වෙනුවෙන් දිවි පිදුවා වූ සියලුම වීරයින්ව මතක් කරන මොහොතේදී ඔවුන් කළ ක්‍රියාවන් නිසා අද අපට ආශිර්වාදය මෙන්ම නිදහසද ලැබී තිබේ. මෙම ජාතික නිදහස ගැන අප සිතන විටදී මා හට සිතෙන වැදගත් කාරණය නම්; යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අප උදෙසා ජීවිතය කැප කර අපිට දුන්නා වූ මහත් වූ නිදහස පිළිබඳවයි.

දේව වචනය අපට උගන්වන කාරණය නම්; *"වරක් අප පාපයට වහල්ව බවයි." (රෝම 6:20)* එසේම ශුද්ධ වූ පාවුලු තුමා රෝම පොතෙහි මෙසේ සඳහන් කරනු ලබයි. *"අනේ මම කාලකන්නි මනුෂ්‍යයෙක්ය! මේ මරණයේ ශරීරයෙන් මා මුදන්නේ කවුද?" (රෝම 7:24)* මෙය ශුද්ධෝ පාවුලු තුමාගේ තත්ත්වය පමණක් නොව අද මුළු මිනිස් සමාජයේම තත්ත්වය මෙයයි. අපද මිදීමක් නැතුව බලාපොරොත්තු රහිත වූ ජීවත් වෙමු.

නමුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මේ මිහිතලයට පැමිණ කල්වාරි කුරුසේදී උන්වහන්සේගේ ජීවිතය පුද කරමින් තුන්වන දින නැවත මළවුන්ගෙන් නැගිට අපට ජයග්‍රහණය ලබා දුන්නේය. උන්වහන්සේගේ මරණය සහ මළවුන්ගෙන්

3 වෙනි පිටුවට ...


Echo of His Call

Christian YouTube Channel!



An opportunity to pray with Pr. S. Sam Selva Raj!

Message & Prayer in 5 minutes!!

English, Hindi, Tamil & Telugu

Every day – From 2.00 A.M.

Tamil Sunday Service – 8.30 A.M.

* Please Subscribe and Share *

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)



## from your dearly beloved brother...

REACHING NATIONS



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
EX MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.org
YOUTUBE CHANNEL
Echo of His Call

**"මක්නිසාද ස්වාමීන් වහන්සේ නුඹේ විශ්වාස භූමියව, නුඹේ පය අසු නොවන ලෙස ආරක්ෂා කරන සේක." (හිතෝපදේශ 3:26)**



සේවයේ 57වැනි වසරට පා තබමු!

57th Year

**ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රේමවන්තයෙනි,**

අපගේ ස්වාමිවූ සහ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයට ප්‍රශංසාවේවා!

මට වයස අවුරුදු හතක් වන විටදී උන්වහන්සේගේ කරුණාව කරණකොට ගෙන මට උන්වහන්සේගේ සේවය කිරීමට ආශාවක් ඇති විය. දේව වචනය පවසා ඇති පරිදි; ***"මක්නිසාද තමන් වහන්සේගේ යහපත් කැමැත්ත නිසා කැමති වෙන්ටත් වැඩ කරන්ටත් නුඹලා තුළ ක්‍රියා කරන්නේ දෙවියන් වහන්සේමය." (පිලිප්පි 2:13)***

දිව්‍යමය කැඳවීම සඳහා ප්‍රථම වතාවට මගේ ජීවිතයට මුල් ඇද්දේ මගේ මව් සභාව වන, නෙල්ලරායිකෝ නම්, නෙයියූර් සභාවේදීය. එදා සිට දෙවියන්වහන්සේ මාව විශ්වාසවන්තව මේ ලෝකයේ අපිරිසුදු දේවලින් ආරක්ෂා කළේය. මාව උන්වහන්සේගේ සේවයට හැඩගස්වමින් පුහුණු කළේය. මගේ ජීවිතයේ පුරාවටම දෙවියන්වහන්සේගේ ප්‍රේමය ඉතා අනර්ඝ ලෙස මට දැනුනේ මේ ලෝකේ දේවලින් මාව ආරක්ෂා කර උන්වහන්සේගේ දරුවෙක් ලෙස හා උන්වහන්සේගේ දාසියක් ලෙස මාව ආරක්ෂා කළේය.

***"නුඹලා ඉවසන්නේ දඬුවම් පිණිසය; දෙවියන් වහන්සේගේ පුත්‍රයන්ට මෙන් නුඹලා කෙරෙහි ක්‍රියා කරන සේක; නිසාද පියා දඬුවම් නොකරන පුත්‍රයා කවුද?" (හෙබ්‍රෙව් 12:7)***



ජීවිත ගමන ඉතා පහසු නොවේ. මා ගමන් කළකළ මාර්ගය මහත් සෝදිසි, බාධා හා කරදර බොහොමයක් තිබුණි. මනුෂ්‍ය ශක්තියට ඉහළින් දරා ගැනීමට අමාරු දේ තිබුණි. එහෙත් උන්වහන්සේගේ පාමුල මා කාලය ගත කරමින් උන්වහන්සේගෙන් ඉගෙන ගත්තෙමි. මගේ ඉතා අමාරු අවස්ථාවන්වලදී උන්වහන්සේගේ කර මත මාව ඔසවා ගෙනගියේය. උන්වහන්සේගේ හදවත තුළ කිසි සැකයක් තිබුණේ නැත. ස්වාමීන්වහන්සේ යහපත්ය, උන්වහන්සේගේ දණ්ඩෙන් හා සැරයටින් මාව සනසන සේක.

පසුගිය වසර 56ක් පුරාවටම උන්වහන්සේගේ සේවය තුළ බහුල වූ අත්දැකීම් මට උන්වහන්සේ දී තිබෙයි. උන්වහන්සේගේ අනර්ඝ කරුණාව කරණකොට ගෙන 2025 අගෝස්තු 10 වන දින මා මගේ 57 වන වසරට පා තැබුවෙමි. ශාරීරිකවත් ආත්මිකවත් උන්වහන්සේ මට ශක්තිය දෙමින් යහපත් සාක්ෂියක් ද මා හට දී තිබේ.

පළමු ශත වර්ෂයේදී අපෝස්තුලුවරුන්ගේ උපදේශ අප සභාවන්ටද වර්තමාන සභාවටද අපගේ දරුවන්ටද උගන්වන්න උන්වහන්සේ උපකාර කළේය. අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයට කෙතරම් ප්‍රශ්න තිබුණත් අපි අපගේ දර්ශනය කරා ගමන් කරමු. මේ සියල්ල දෙවියන්වහන්සේගේ කරුණාව නිසාය.

උන්වහන්සේට සියලු ගෞරවය මහිමය වේවා!

## අපගේ වර්තමාන සේවය,

1. පැය 24ක යාච්ඥා සේවය,
2. සභා රෝපණය කිරීම,
3. කැඳවීමේ ප්‍රතිරාවේ සේවය මාස් පත්‍රාභාෂා 16කින් නිකුත් කිරීම.
4. භාෂා 3කින් පැවැත්වෙන පාඩම් මාලාව
5. භාෂා 2කින් පැවැත්වෙන දේවධර්ම පාඩම්මාලාව,
6. වේලච්චරි, සන්දෝශපුරම් සහ චේපාක්වල නවාතැන් පහසුකම් සමඟ පැවැත්වෙන නෙහෙමියා බයිබල් විදුහල,
7. ශුභාරංචි පත්‍රිකා මුද්‍රණාලය
8. ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසල,
9. සම්මේලන,
10. සුභාරංචි රැස්වීම් මාලාවන්
11. කැඳවීමේ ප්‍රතිරාවය You Tube සේවාවන්,
12. එළිමහන් රැස්වීම් පැවැත්වීම,

දෙවියන්වහන්සේ තවත් මහත් වූ දේ කරන පිණිස මා මෙම සේවයේ දිගටම නිරතව සිටිමි. තවද සියලු ආකාරයෙන් සමහරකු ගලවන පිණිස මම සියල්ලන්ට සියල්ල වුනෙමි. (1 කොරින්ති 9:12)

***''.....සූදානම් වූ සෙනඟක් ස්වාමීන් වහන්සේට පිළියෙළ කරන පිණිස ද ....'' (ලූක්1:17)***

මගේ ගමනේදී බොහෝ අමාරුකම්, වේදනාවන්, දුර්වලතාවයන්, වැටීම් හා බලාපොරොත්තු රහිත තැන් තිබුණත්, මම ශක්තිමත්ව දෙවියන්වහන්සේගේ බලයෙන් යුතුව මෙම සෑම අභියෝග මැදදීම උන්වහන්සේ මට මග පෙන්වමින්, සියල්ල සපයමින් හා විශ්වාසවන්ත මිත්‍රයෙක් ලෙස මට මග පෙන්නමින් ගෙනයයි.

මගේ දුක්බර අවස්ථාවේදීත් මා ප්‍රීතිමත් වන අවස්ථාවලදීත් සිටගත් ඔබ සැමට ස්තුතියි! දෙවියන්වහන්සේ ඔබ සැමට ආශිර්වාද කරන සේක! උන්වහන්සේගේ මෙහෙය උදෙසා කැප වූ තව බොහෝ දේව දාස දාසීන් නැගිටුවන පිණිස මා අවංකවම යාච්ඥා කරමි.

''අඳුර මාව වට කරන මොහොතේදී ස්වාමීන් වහන්සේ ඔබ මා සමඟයි මා අනාථ වී මවිත වූ කල්හි, ඔබ මාව වැළඳ ගන්නේය''

1. මා කාන්තාරයේ මැද ගමන් කරද්දි ඔබ මා ආරක්ෂා කරන්නේය, මාර්ගය රළු වුවත්
   ඔබගේ කරුණාවෙන් මාව සරසන සේක.
2. මාරාහී වතුර උන්වහන්සේ මිහිරි කරයි, මගේ ප්‍රේමවන්ත යේසු මගේ යේසුස් වූයේය.
   යේසුනී, ඔබගේ බලවත් හස්තයෙන් දුප්පතුන් රැගෙන යන සේක.
3. මගේ පාද ලිස්සන විට ඔබගේ කරුණාව මාව රැක ගන්නේය, ඔබ මාව ආලේප
   කරමින්මාව ඔසවන සේක,

ස්වාමීන් වහන්සේගේ කරුණාව ඔබ සැම දෙනා සමඟ පවතීවා!

*Pr. S. Sam Selva Raj*
E.mail : sam@echoofhiscall.org

*1 පිටුවෙන්....*

නැගිටීම කරන කොටගෙන පාපයෙන් ශාපයෙන් හා මරණයෙන් උන්වහන්සේ අපට ජයග්‍රහණය ලබා දුන්නේය. ''එම්බා මරණය, තාගේ කටුව කොයින්ද?'' කියා ස්වාමීන් වහන්සේගේ යාගය කරන කොට ගෙන අපට සැබෑ සදාකාලික නිදහසක් ලබා දුන්නේය. මෙය සත්‍යතාවයකි.

යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක; ***''මාර්ගයද සැබෑවද ජීවනයද මමය....'' (යොහාන් 14:6)*** නැවතත් ස්වාමීන් වහන්සේ කතා කරමින්; ***''නුඹලා සැබෑව දැනගන්නවා ඇත, සැබෑවද නුඹලා නිදහස් කරන්නේය.'' (යොහාන් 8:32)*** හී සඳහන් කරයි. සත්‍ය නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.

අපට මෙවැනි අනර්ඝ නිදහසක් ලැබී තිබෙන නිසා එම නිදහස තුළ අපි කුමක් කරනවාද?

යේසුස්වහන්සේ මෙයට පිළිතුරු දෙන්නේ; ***''නුඹලා මා තෝරා ගත්තා නොව මම නුඹලා තෝරාගෙන පත් කෙළෙමි. එසේ කළේ නුඹලා ගොස් එල දරන පිණිසත් නුඹලාගේ පල පවතින පිණිසත් ......'' (යොහාන් 15:16)***

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළින් අපට ලැබී තිබෙන නිදහස උන්වහන්සේගේ මහිමය උදෙසා එල දැරීමට පාවිච්චි කරමු. අප තේරුම් ගෙන තිබෙන සත්‍යතාවය නම්; යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපහට නිදහස ලබාදුන්නාක් මෙන්ම උන්වහන්සේගේ මෙම නිදහස තුළින් අප සියල්ලෝමය එල දැරිය යුතු බව උන්වහන්සේ බලාපොරොත්තුවයි.

## (1). උන්වහන්සේ තුළ පවතින්න !

අපට සැබවින්ම එල දැරීමට ඇති එකම මාර්ගය නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ පැවතීමයි. දේව වචනය අපට මෙසේ උගන්වයි; ***''යමෙක් මා තුළෙහි පවතින්නේද, මම ඔහු තුළෙහි පවතිම්ද, ඒ තැනැත්තේ බොහෝ එල දරයි; මක්නිසාද මාගෙන් වෙන්ව කිසිවක් කරන්ට නුඹලාට බැරිය.'' (යොහාන් 15:5)***

මෙහි සඳහන් වන්නේ උන්වහන්සේගේ කැඳවීම තුළ එල දරන්නා වූ ජීවිතයක් පිළිබඳවයි.

### එල දැරීම :

උන්වහන්සේ තුළ අපි පැවති සිටින විට අප එල දරන්නා වූ අය වෙමු. පහත සඳහන් කර තිබෙන්නාවූ රූප සටහන අපගේ එල දැරීමට තිබෙන සම්බන්ධතාවය ගැන පෙන්වයි.




*''......මාගෙන් වෙන්ව කිසිවක් කරන්ට නුඹලාට බැරිය. '' (යොහාන් 15:5)*

## (a). සම්බන්ධතාවය!

ක්‍රිස්තුස්වහන්සේ සමඟ අපට තිබෙන්නාවූ මූලික සම්බන්ධතාවයයි. මෙය අන්‍ය සම්බන්ධතාවයක් නොව; අත්‍යාවශ්‍ය ජීවන දායක බැඳීමකි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එය විස්තර කරන්නේ; උන්වහන්සේ තුළ පැවති සිටීම යනු; දිගුකල් පවතින ස්ථිරභාවයයි.

## (b). පෝෂණය කිරීම!

පෝෂණය වීම යනු දෙවන අදියරයි. උන්වහන්සේ සමග තිබෙන සම්බන්ධතාවය කරන කොටගෙන අපවම හැඩ ගැසීමටත් මිදි වැලෙහි තිබෙන සියලුම සාරත්වයන් ලබා ගැනීමත්ය. එලෙස අපට ලැබිය යුතු සියලුම පෝෂණය ක්‍රිස්තුස් වහන්සේ තුළින් ලබා ගැනීමයි. එනම්; උන්වහන්සේගේ ප්‍රඥාව, ශක්තිය, ප්‍රේමය සහ කරුණාවයයි. මෙලෙස අප පෝෂණය වීමෙන් ශක්තිමත්භාවය අපට ලබාදෙයි.

## (c). අධික ඵල දැරීම!

දෙවියන්වහන්සේ සමඟ තිබෙන සම්බන්ධතාවය සහ උන්වහන්සේ තුළින් පෝෂණය වීමේ ප්‍රතිඵලය වන්නේ; අප අධික ලෙස ඵල දැරීමයි. ක්‍රිස්තුස්වහන්සේ සමග අපට තිබෙන්නා වූ ඉතා ශක්තිමත් සම්බන්ධතාවය නම්; උන්වහන්සේගේ ගුණාංග අනුව අප වෙනස් වීමයි. එවිට අප ඵල දරයි. (ගලාති 5:22 -23) එසේනම් අප ඵලදැරීමට ස්වාමීන් වහන්සේ සමඟ තිබෙන සම්බන්ධතාවය තුළ අප නිතරම පැවතී සිටිය යුතුයි. අප උන්වහන්සේ සමග තිබෙන සම්බන්ධතාවය පමණක් නොව යොහාන් 15:5 හි සඳහන්ව ඇති පරිදි අපි ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ පමණක් රඳා පැවතී සිටිය යුතුයි. මන්ද උන්වහන්සේ පවසනු ලැබුවේ; මාගෙන් වෙන්ව නුඹලාට කිසිවක් කිරීමට නොහැකි බවයි. එබැවින් අප ඉතා අධික ලෙස ඵල දරමු.

## (2). ක්‍රිස්තුස් වහන්සේ තුළ නොකඩවා රැඳී සිටින්නේ කෙසේද?

ක්‍රිස්තුස්වහන්සේ තුළ රැඳී සීමට අත්‍යාවශ්‍යවන්නා වූ කරුණු 4ක් පහත සඳහන් කරමි.

## (a). වචනය

දේව වචනය කියවීම දැනගැනීමට පමණක් නොව එය ආත්මික පෝෂණය සඳහාද අප දිනපතාම දේවචනය කියවා එය මෙනෙහි කළ යුතුයි. එවිට අප උන්වහන්සේ වාගේ වෙයි. *''ඔබට විරුද්ධව පව් නොකරන පිණිස ඔබගේ වචනය මාගේ සිතේ නිධානය කරගතිමි.'' (ගීතාවලිය 119:11)* දෙවියන් වහන්සේගේ වචනය අපට ආලෝකයකි. එය අපව නිවැරදි කිරීමට පමණක් නොව අන් අයවත් ප්‍රේමයෙන් හා සැබෑකමින් වෙනස් කිරීමට මෙම වචනය අපට උපකාරී වෙයි.

*''ක්‍රිස්තුස් වහන්සේගේ වචනය නුඹලා තුළ සියලු ප්‍රඥාවෙන් සමෘද්ධව වාසය කෙරේවා නුඹලා ගීතිකාවලින්ද කවි වලින්ද ද ආත්මික ගී වලින්ද එකිනෙකාට උගන්වමින් දැනමුතුකම් දෙමින් නුඹලාගේ සිත් වල අනුග්‍රහය ඇතුව දෙවියන් වහන්සේට ගීතිකා කරපල්ලා.'' (කොලොස්සි 3:16)*

අප දේව වචනය කියවනවාක් මෙන්ම එම වචනය මෙනෙහි කිරීම ඉතා වැදගත් වෙයි. මෙය අප විටින් විට නොව නොකඩවාම කළ යුතු දෙයකි. එවිට දෙවියන් වහන්සේගේ වචනය අපගේ මනස අලුත් කරන කරනු ලබයි.

....Contd. to page 6





**ඉතා හදිසි දැනුම් දීමක්!**

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිදු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

අපගේ ලිපිනය:

ECHO OF HIS CALL,
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: sam@echoofhiscall.org

GREAT COMMISSION PARTNERS

ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**අගෝ:19 -** අපගේ ප්‍රධාන සභාවේ පවත්වන තරුණ සහභාගිත්වයට දෙවියන්වහන්සේ ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**අගෝ:20-** 2025 ජුලි මස 1 වෙන දින සංදෝෂ පුරම්හි නෙහෙමියා බයිබල් විදුහල නැවත ආරම්භ කිරීමට උපකාර කළ නිසා ස්තුති කරන්න.

**අගෝ:21 -** 2025 අගෝස්තු 10 වන දින පැවති අපගේ 56වන සංවත්සරයට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**අගෝ:22-** එකමුතුකමෙන් හා කැපවීමෙන් සේවය කරන කැපවූ සේවයකින් අපිට ලබාදී තිබෙන නිසා ස්තුති කරන්න.

**අගෝ:23 -** ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ විදුහල්පතිතුමන්ට, කාර්ය මණ්ඩලයට සහ ශිෂ්‍යයින්ට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**අගෝ:24-** සදාචාරාත්මකව සහ මූල්‍යමය වශයෙන් අපට සහාය දෙන විශ්වාසවන්ත හවුල්කරුවන් ලබා දී තිබෙන නිසා ස්තුති කරන්න.

**අගෝ:25-** අපගේ කාර්ය මණ්ඩලයේ සියලු සේවකයින් සහ ඔවුන්ගේ පවුල් ආරක්ෂා කළ නිසා ස්තුති කරන්න.

**අගෝ:26-** ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේශන් පාසලේ නව ඇතුළත් කිරීම් නිසා ස්තුති කරන්න.

**අගෝ:27-** අපගේ සේවයට උපකාර කරන්නන්ට දෙවියන් වහන්සේ ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න

**අගෝ:28-** අපගේ ප්‍රධාන පාලක තුමා සහ ඔහුගේ පවුලට දෙවියන් වහන්සේගේ සැලකීම නිසා ස්තුති කරන්න

**අගෝ:29-** අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සහකාර කර්තෘවරුන් සහ ඔවුන්ගේ පවුල් නිසා ස්තුති කරන්න.

**අගෝ:30-** ධර්මදූත සේවයෙහි යෙදෙන අපගේ මිෂනාරීවරුන් සහ ඔවුන්ගේ පවුල් ආරක්ෂා කළ නිසා ස්තුති කරන්න.

**අගෝ:31-** පසුගිය මාසය පුරාම අපගේ සියලුම අවශ්‍යතාවයන් සැපයූ නිසා ස්තුති කරන්න.

**සැප්:01-** අපගේ සභාවන්වලට නව සාමාජිකයින් එකතු කර තිබෙන නිසා ස්තුති කරන්න.

**සැප්:02-** අපගේ නෙහෙමියා බයිබල් විදුහල් වලට නව ශිෂ්‍යයින් ඇතුලත් කිරීමට කරුණාව දී තිබෙන නිසා ස්තුති කරන්න.

**සැප්:03-** ශ්‍රී ලංකා දේශයට දෙවියන් වහන්සේගේ සමාදානය හා කරුණාව ලබාදී තිබෙන නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**සැප්:04:** ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල සිටින කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ ඇදහිලිවතුන් සහ ඔවුන්ගේ පවුල්වලට යහපත් දේ තුළින්ආශිර්වාද කරන පිණිස යාච්ඤා කරන්න

**සැප්:05-** අපගේ යාච්ඤා හවුල්කරුවන්, දායක හවුල්කරුවන්, ඇදහිල්ලේ හවුල්කරුවන්, ජීවිත කාලය පුරා හවුල්කරුවන් හා සේවයේ සියලු හවුල්කරුවන්ගේ පවුල්වලට අවශ්‍යතා සපයන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:06-** ශ්‍රී ලංකා දේශයෙහි තිබෙන්නා වූ සියලු කිතුණු සභාවන්ගේ එකමුතුකම සහ යහපත් සාක්ෂියක් ඇතිව සේවය ඉදිරියට යන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:07-** ලෝකයෙහි සිටින්නා වූ සියලු කාන්තාවන් සහ ළමයින්ට එරෙහිව තිබෙන හිංසනයන් මුලිනුපුටා දමන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:08-** අපගේ ජ්‍යෙෂ්ඨ දේවගැති ගරු සැම් සෙල්ව රාජ් දේවගැති තුමාව, ඔහුගේ විවිධ සේවාවන් තුල බලවත් ප්‍රඥාවකින් සහ අභිෂේකයකින් යුතුව පාවිච්චි කරන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:09-** අපගේ කාර්ය මණ්ඩලයේ සියලු සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල් වලට දිව්‍ය ආරක්ෂාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:10-** අපගේ ශුභාරංචි පත්‍රිකා මුද්‍රණාලය සහ එහි සේවය කරන කාර්ය මණ්ඩලය අතර කාර්යක්ෂමතාවය සහ විශිෂ්ටත්වය වැඩිවන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:11-** අපගේ නෙහෙමියා බයිබල් විදුහල උදෙසා ශ්‍රම දායකත්වයෙන් උගන්වනු ලබන ගුරුවරුන් සහ පරිවර්තකයන් නිසා යාච්ඤා කරන්න.

**සැප්:12-** කිතුනු දේශකයින් සුභාරංචිය විශ්වාසවන්තව හා දේව වචනයට එකඟව ප්‍රකාශ කරන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:13-** අපගේ නෙහෙමියා බයිබල් විදුහලට ඇතුළත් වෙන සංඛ්‍යාව වැඩිවන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:14--** සියලු ජාතීන් ඒකත්වයක් සහ සමගිය ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:15 -** මත්පැන් හා මත්කුඩු වලට ඇබ්බැහි වී සිටින අය සහ සියලු දුෂ්ටකම් වලට ගොදුරු වී සිටින්නන් සැබෑ පසුතැවිල්ලක් සහ පරිවර්තනයක් ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:16--** අපගේ සියලුම සේවාවන් පුළුල් වන පිණිස සහ ශුභාරංශය මුළු ලෝකයේ පුරාම ව්‍යාප්ත වන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:17--** අපගේ සියලුම සහකාර කර්තෘවරුන් සහ ඔවුන්ගේ පවුල්වලට ආරක්ෂාව සහ සැපයීම ලබා දෙන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:18--** සෑම පවුලක්ම එකමුතුකමින් හා සහයෝගිකමෙන් ජීවත්වනන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

## (b). යාච්ඤාව

යාච්ඤාව යනු දෙවියන්වහන්සේ සමග දෙයාකාරයකට සම්බන්ධතාවයක් පැවැත්වීමයි. එනම්; අප ස්වාමීන්වහන්සේට කතා කරයි. ස්වාමීන් වහන්සේ අපට කතා කරයි. සමහර අවස්ථාවන්වලදී අප වෙළඳ සැලකටට ගොස් අපට අවශ්‍ය බඩු ඉල්ලනවාක් මෙන්ම අප යාච්ඤාවෙනුත් මෙසේ ඉල්ලීම පමණක් කරනු ලබයි. නමුත් නොකඩවාම යාච්ඤා කිරීම අපත් දෙවියන් වහන්සේත් අතර තිබෙන්නා වූ මහත් සම්බන්ධතාවයකි.

*"නොකඩවාම යාච්ඤා කරපල්ලා" (1තෙසලෝනික 5:17)*

අප නොකඩවාම යාච්ඤා කරන්නේ කෙසේද? අප මුළු දවසේදීම දෙවියන් වහන්සේ සමග කතා කිරීමට එනම්; කෑම පිසින විට, වැඩ කටයුතුවල නිරත වන විට, පිරිසිදු කරන විට හා වාහනයක් පදවන විට අප නොකඩවාම යාච්ඤා කිරීමට හැකිය.

## (c). කීකරුකම

තුන්වන කාරණය නම් කීකරු වීමයි. යොහාන් 15:10 හි යේසුස්වහන්සේ පවසන්නේ කීකරුවීම සහ උන්වහන්සේ තුළ රඳා පවතීම පිළිබඳවයි. එනම්; උන්වහන්සේට කීකරුවීම අපට බරක් වීමට නොහැකියි. එය උන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන දෙයකි. එය අපගේ ප්‍රේමය කරන කොටගෙන අප උන්වහන්සේට දක්වන ප්‍රතිචාරයකි.

*"නුඹලා මට ප්‍රේම කරනවා නම් මාගේ ආඥා රක්ෂා කරන්නහුය." (යොහාන් 14:15)*

## (d). සහභාගීකම

හෙබ්‍රෙව් 10:24-25 දක්වා පද තුළ සඳහන් කරන ආකාරයට උන්වහන්සේගේ දරුවන් එකට රැස්වීමේ වැදගත් භාවය අද බොහෝ අය නොදනියි. අද මනුෂ්‍යයන් සභාවට නොපැමිණ You Tube හරහා සභාවට සම්බන්ධ වෙයි. අන්තර්ජාලයෙන් අපට ආත්මික ලෙස යමක් ලබා ගැනීමට හැකියාවක් තිබුණත් පුද්ගලික ලෙස දේව දරුවන් සමග එකතුවී නමස්කාර කිරීමේ සැබෑ ප්‍රීතිය ලබා ගැනීමටත් නොහැකිවෙයි. අපගේ සහභාගිත්වය තිබෙන විට අප එකිනෙකා ගැන ගණන් දීම, එකිනෙකාව ධෛර්යමත් කිරීම හා එකිනෙකාව ශක්තිමත් කිරීම ආදී දේ සිදුවෙයි.

## (3). අප තුළ ඉතිරිව ඇති ඵලය - උත්සාහවන්ත ලෙස ඵල දරමු.

අප තුළ තිබෙන්නා වූ ඵල දැරීමේ හැකියාව අප නොකඩවාම උත්සාහ වන්ත ලෙස ඉටුකළ යුතුයි.

යේසුස්වහන්සේ අපට පල දරන්නේ කියා පවසනු ලැබුවේ උන්වහන්සේ අප තුළ තිබෙන ඵල අපගේ ජීවිතයෙහි අවසානය දක්වාම තිබිය යුතුයි කියාය.



මෙය ස්වභාවධර්මයෙහි විඳ දරා ගැනීමේ බලවත් සංකේතයක් වන සීකුවියා වෘක්ෂයෙහි රූපයකි. මෙම වෘක්ෂය වසර 3000කට වඩා පවතී. තවද ගින්දර සුළි සුළං ආවත් ඒවාට විරුද්ධව සිටීමට මෙම වෘක්ෂයට හැකිය.

පලදැරීමක් තුළින් අපද ශක්තිමත්ව සිටිය යුතුයි. මන්ද සැබෑ වර්ධනය වීම සහ ඵල දැරීම කියා පවසන්නේ; කුමන බාධාවන් ප්‍රශ්න හා කරදර ආවත් අප ඉතා උනන්දුවෙන් ඵල දැරිය යුතුයි යන්නයි.

## (a). ආරම්භක වර්ධනය.

අලුතෙන් පැමිණෙන්නාවූ ඇදහිලිවන්තයින් ඔවුන්ගේ ජීවිතයේ ආත්මික ලෙස ඉතා වැදගත් වෙනස් වීමක් අත්දකියි. ඒ තුළ බොහෝ සතුටු වෙයි. ක්‍රිස්තුස් වහන්සේ තුළ අප පටන් ගන්නා වූ ආරම්භක සම්බන්ධතාවය තුළින් අපට ප්‍රීතිය හා සතුට පමණක් නොව කල් යාමත් සමඟම බොහෝ පරීක්ෂා වලට අපව ලක්වෙයි. එවිට පටන් ගැන්මේදී තිබූ වර්ධනය අප තබා ගත යුතුයි.

## (b). පරීක්ෂා කිරීමේ කාලය

ස්වාමීන්වහන්සේ සමග අපට වර්ධනය වීමට කාලයක් පැමිණෙයි. එම අවස්ථාවේදී අප කොතරම් දුරට උන්වහන්සේ තුළ සිටිනවාද කියා අපව පරීක්ෂා කරයි. මතෙව් 13 වන පරිච්ඡේදයෙහි යේසුස්වහන්සේ වපුරන්නාගේ උපමාව තුළින් කතා කළ විටදී අපගේ වර්ධනය වීම කොයි ආකාර පොළවක වැටුණු බීජයක වර්ධනය වනවාද කියා පෙන්නුම් කරයි.

සමහරු ඔවුන්ගේ ජීවිතයට පැමිණෙන කරදර නිසා ඉක්මනින්ම පරවී යයි. අද බොහෝ දෙනාගේ ජීවිතවලට ප්‍රශ්න කරදර පැමිණෙන විටදී ඔවුන් ස්වාමීන් වහන්සේගෙන්

....Contd. to page 8

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press - Publications
11. St. Paul's Matriculation School - Village English High School
12. Sunday Schools : 10.30 a.m. & 4.00 p.m. Sunday
13. **Early Morning Service : 5.30 a.m. Sunday**
14. **Tamil Service : 8.30 a.m. Sunday**
15. **Youth Service : 11.00 a.m. Sunday**
16. **Fellowship Lunch : 12.30 p.m. Sunday**
17. **Travel to Mission Centres : 1.30 p.m. Sunday**
18. **Children Ministry : 3.00 p.m. Sunday**
19. **Hindi Service : 4.00 p.m. Sunday**
20. **Telugu Service : 5.00 p.m. Sunday**
21. **Telugu, Hindi & Telugu Service : 6.00 p.m. Sunday**
22. Women's Prayer : 5.30 p.m. Wednesday
23. Men's Prayer : 7.00 p.m. Friday
24. Discipleship Meeting : 6.00 p.m. Saturday
25. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
26. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
27. Ministers' Meeting : 6.00 p.m. First Saturday
28. Parents' Prayer : 4.00 p.m. First Sunday
29. Night Prayer : 9.30 p.m. Third Friday
30. Fasting Prayer : 9:30 a.m. Second Saturday
31. Holy Communion : Second Sunday Services
32. Youth / Kid Prayer : 10.00 p.m. daily
33. Staff Devotion : 9.00 a.m. daily
34. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)


Pray for

**NEHEMIAH BIBLE COLLEGES,**

Chepauk & Santhoshapuram, Velachery Chennai.

Qualification : 10th Standard & above

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE REACHING NATIONS

**Rush for Admission!** Medium :Tamil (Part Time) Hindi (Residential) (Sponsorship Available)

Diploma in Theology

Recognised by International Christian Leaders & Senior Pastors for the past 55 years

**Contact : The Chairman, Nehemiah Bible College.**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.

Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858

E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

"...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

## දෙවියන්වහන්සේගේ අලංකාර දෑතේ අනර්ඝ සේවකයෝ

බොහෝ දවස්වලදී දෙවියන් වහන්සේ මගේ ජීවිතයට මහත් වූ බලවත් දේ කළේය. එසේම මගේ සේවයේදී බොහෝ හාස්කම් කරමින් දෙවියන් වහන්සේ මාව ගෞරවයට පත් කළේය.

අපගේ මූලස්ථානය සහ අනෙකුත් ස්ථානවලත් තවත් බොහෝ ස්ථානවලත් කරගෙන යන්නා වූ සේවය ඉතා බලවත් ලෙස වර්ධනය කිරීමට ස්වාමීන් වහන්සේ උපකාර කළේය. ස්වාමීන් වහන්සේට ප්‍රශංසාවේවා!

වරක් මා ඔස්ට්‍රේලියාවේ සිඩ්නි, මැල්බන් සහ බ්‍රිස්බන් නැමැති නගරවල සේවය කළේය. බොහෝ අය දෙවියන් වහන්සේගේ ස්පර්ශය ලැබුවේය. දිනක් ඔස්ට්‍රේලියාවේ සිටි යුවළක් මා නතර වී සිටි නිවසට මා බැලීමට පැමිණ ඔවුන් කඳුළු සහිතව පැවසුවේ ''අප විවාහ වී වසර දහතුනක් වුවත් අපිට ළමයි නැති නිසා අප දික්කාසාද වීමට යන නිසා එය සමාදානයෙන් සිදුවෙන පිණිස යාච්ඥා කරන්න කියා" ඔවුන් පැවසුවේය. ඔවුන්ගේ රටේ දික්කසාදය ඉතා පොදු දෙයකි.

මෙය අසා මට බොහෝ සේ දුක සිතුනි. මා ඔවුන්ගේ ඇසුවේ; ''දෙවියන්වහන්සේ ඔබලාට දරුවෙක් දෙන පිණිස මා යාච්ඥා කරන්නද?" කියා ඇසුවෙමි. ඔවුන් සිනාසී පැවසුවේ; ' ඔවුන් ඉතා දක්ෂ වෛද්‍යවරුන් වෙතට ගොස් බොහෝ ප්‍රතිකාර ලැබූ නමුත් කිසි පිළිතුරක් නොලැබිණි. යාච්ඥාවෙන් කෙසේද දරුවෙක් ලැබෙන්නේ ' කියා ඇසුවේය. මා ඔවුන් සමග වාඩි වී ඇදහිල්ල ගැන කතා කර ඔවුන්ට උපදෙස් දී පසුව මා ඔවුන් දෙසා යාච්ඤා කළෙමි.

ස්වාමීන් වහන්සේට මා ස්තුති වන්ත වන්නේ; මාස දෙකකට පමණ පසු මා මා ඔස්ට්‍රේලියාවේ සිට නැවත ඉන්දියාවට පැමිණීමට ගුවන් තොටුපොළ වෙතට පැමිණි විට ලොකු තෑගි පාර්සලයක් අතැතිව එක් යුවළක් මා වෙතට ආවේය. ඔවුන් මා වෙතට පැමිණ අඬ අඬා විනාඩි දහයක් පමණ මා සමග ගත කළේය. ඉන්පසු එම ස්වාමි පුරුෂයා මට මෙසේ පැවසුවේ; ''මගේ බිරිඳ දැන් දරුවෙක් ලැබෙන පිණිස ගර්භනීයව සිටිනවා, වෛද්‍යවරුන් එය ස්ථිර කළා" කියා පැවසුවේය. පසුව ඔවුන් අතැතිව තිබූ පාර්සලය මටදී නැවත ඔවුන් ගියේය. ඔවුන් මට ලබා දුන් පාරිසලයෙහි මගේ සේවයට අවශ්‍ය බොහෝ දේ තිබුණි. පසු කාලයේදී ඔවුන්ට දෙවියන් වහන්සේ දියණියක් ලබා දුන්නේය. පසුව පුතුන් දෙදෙනෙක්ද ඔවුන්ට ලබා දුන්නේය.

ප්‍රිය මිත්‍රය, මෙවැනි හාස්කම් ඔබගේ ජීවිතයටත් කළ හැකිය. දෙවියන් වහන්සේව විශ්වාස කරන්න. උන්වහන්සේ ඔබගේ සිතේ සියලු ආශාවන් ඉෂ්ට කරනු ඇත. මා විශ්වාස කරන්නේ; දෙවියන් වහන්සේ ඔබටත් දරුවන් නොමැති නම් දරුවෙක් දීමටත් රෝගීව සිටින අයට සුවයත් ආදී බොහෝ ආශිර්වාද ස්වාමීන් වහන්සේ ඔබටත් කිරීමට හැකිය.

යේසුස්වහන්සේ ඊයෙත් අදත් හෙටත් සදාකාලයටම ඒකාකාරය උන්වහන්සේගේ නාමයට ප්‍රශංසාවේවා!

*************

....Contd. from page 6

ඇත් වෙයි. නමුත් අප මෙවැනි සෝදිසි කරදර බාධා තුළින් ගමන් කොට අපගේ වර්ධනය තබාගත යුතුය.

### (c). ඇදහිල්ලේ අඛණ්ඩව සිටීම!

ගලාති 6:9 වන පදයෙන් අපට මතක් කර දෙන්නේ; අප විනයානුකූලව අපගේ විශ්වාසවන්ත අඛණ්ඩව තබා ගන්නේ කොසේද ?

***සමහර අවස්ථාවන්වලදී අපගේ ආත්මික ජීවිතයේ වියළි කාලයන් පැමිණෙන විටදීම 'අප හැමදේම අත් හරිමු'යි කියා පැවසීමට පුළුවනි. නමුත් අප ඇදහිල්ලෙන් අඛණ්ඩව ඉදිරියට යනවා නම්; එය අපගේ ආත්මික ජීවිතයේ මේරූ භාවය පෙන්නුම් කරයි.***

මගේ පියාණන් සභාව ආරම්භ කළ විටදී මගේ පියා සමග එහි සිටියේ මා සහ මගේ මව පමණක් බව මට මතකය. මගේ මව දෙවෙනි දරුවා ලැබීමට ගිය අවස්ථාවේදී සෑම ඉරුදිනකම සිටියේ මා සහ මගේ පියා පමණයි. නමුත් මගේ පියා දහසක් දෙනෙකුට දේශනා කරන්නාක් මෙන් ඔහු දේශනා කළේය. ඔහුට ගැලවීමට මනුෂ්‍යයන්ට ඉදිරියට ඒමට ආරාධනා කරන විටදී සෑම සතියකම මම ඉදිරියට ගියෙමි.

මෙසේ කාලය ගත වී ගියේය. මාස ගණනාවක් යනතුරුත් කිසිම ප්‍රතිඵලයක් තිබුණේ නැත. නමුත් මගේ

පියා මෙම සේවය කිසිවිටක අත්නොහැර අඛණ්ඩව කරගෙන ආවේය.

ස්වාමීන්වහන්සේට ස්තුති වේවා! දෙවියන් වහන්සේ අපගේ සභාවට ආශිර්වාද කළ කල්හි අපගේ සභාව වර්ධනය වූ එක පමණක් නොව ඉන්දියාව පුරාම සහ ලෝකයේ තවත් රටවල් වලද ශාඛා සභාවන් ආරම්භ කිරීමට උන්වහන්සේ අපට උපකාර කළේය.

එබැවින් සහෝදරයා ඉදිරියටම ගමන් කරමින් ස්වාමීන් වහන්සේ තුළ ඵල දරන්න.

## (d). කල් පවතින උරුමය!

දෙවියන්වහන්සේ අපව කැඳවා තිබෙන්නේ අපගෙන් පසුව අපගේ උරුමය කල් පවතින පිණිසයි. මෝසෙස්, යෝෂුවා, දානියෙල්, පාවුල්, පේතෘස්, එස්තර් මරියා සහ තවත් මෙවැනි අය ඔවුන්ගෙන් පසුව උරුමයක් තබා ගියාක් මෙන්ම අපෙන් පසුව අපත් උරුමයක් තබා යා යුතුයි.

2 තිමෝති 2:2 හි ශුද්ධවූ පාවුලු තුමා මෙසේ කතා කරයි; *''ආත්මික ලෙස පරම්පරාවෙන් පරම්පරාවට අප ඵල දැරීම අවශ්‍යයි"* කියාය.

අපගේ දරුවන් සහ අනාගත පරම්පරාව අප දෙස බැලීමට අප යමක් තබා යා යුතුයි. දෙමාපියන් හැටියට අපිට මහත් වගකීමක් තිබෙයි. ආත්මික ආදර්ශය ඊළඟ පරම්පරාවට තබා යාමට විශ්වාසවන්තව මට දෙවියන්වහන්සේ තුළ මඟ පෙන්වූ මගේ දෙමව්පියන්ටත් ආච්චිටත් මම ස්තුතිවන්ත වෙමි.

ඒ අයගේ ජීවිත දෙස බලමින්, ඔවුන් කතා කළ දේ ඇසීමෙන් මට දෙවියන් වහන්සේ තුළ මහත් වූ බලපෑමක් ඇති කළේය. ඔවුන්ගේ උරුමය අපට දී ගිය නිසා මා ස්වාමීන් වහන්සේට ස්තුති කරමි.

යොහාන් 15:16 හි සඳහන් කර ඇති ආකාරයට යේසුස් වහන්සේ අපව තෝරාගෙන අපට පවසන්නේ; ''නුඹලා ගොස් ඵල දරන්න. ඒ පල පවතින පිණිස ඵල දරන්න. සෑම කාලයේදීම නොකඩවාම ඵල දරන්න." කියාය.

## (4). බාධාවන් සහ අභියෝග!

අප සියලු දෙනාගේම ආශාව නම් දෙවියන් වහන්සේ තුළ වර්ධනය වී උන්වහන්සේ තුළ ඇදහිල්ලෙන් ස්ථිරව සිටීමයි. නමුත් අපගේ ආත්මික වර්ධනය පිණිස අපට බොහෝ අභියෝග හා බාධා ඇති වෙයි.

## (අ). කාර්යබහුලත්වය

අපිට තිබෙන්නා වූ විශාල බාධාව නම්, අපගේ කාර්යය බහුලත්වයයි. අද වර්තමානයේ තිබෙන්නාවූ තාක්ෂණය කොපමණ දියුණුව තිබුණත් අපි අපගේ වේලාවන් පාලනය කිරීමට නොදනිමු. මන්ද අපි ඉතාම කාර්ය බහුලය. එම කාර්යය බහුලත්වය නිසා පවුලේ වගකීම්, සභාවේ තිබෙන වැඩ කටයුතු අප නිතරම අතපසු කරයි. නිතරම අප අසන දෙයක් නම් ''මා හරියට කාර්යය බහුලයි " කියාය. අපි කාර්යය බහුලයි කියා පැවසීමෙන් අදහස් වන්නේ; අපට දෙවියන් වහන්සේගේ ක්‍රියාවන් කිරීමට එය බාධාවක් බවයි. අප යක්ෂයාගේ වියගහ අප පිට තබාගෙන අපි බොහෝ කාර්යබහුලයි කියා පවසමින් දෙවියන් වහන්සේ සමඟ කාලය ගත කිරීමටද අපට වේලාවක් නැත. බලවත් යාච්ඤාවන් සමඟ අපගේ කාල වේලාවන් සකස් කර ගත යුතුයි. යේසුස් වහන්සේගේ සියලුම කාර්ය බහුලත්වය තුළින් උන්වහන්සේ දෙවියන්වහන්සේට යාඥා කිරීමටත් උන්වහන්සේ සමග කාලය ගත කිරීමටත් වැඩි වේලාවක් දුන්නේය. (මාර්ක් 1:35) ඔබගේ වැඩසටහන් වලදී අනවශ්‍ය දේ අත්හැර දෙවියන් වහන්සේ සමඟ කාලය ගත කිරීමට අවස්ථාව ගන්න.

## b). ඩිජිටල් මුලා කිරීම!

අද සමීක්ෂණවලින් පෙන්නුම් කරන්නේ මනුෂ්‍යයන් පැය 3 - 4 ක පමණ කාලයක් ස්මාර්ට් ජංගම දුරකථන සමඟ ගත කරන කාලය පොදු දෙයක් බවයි. නමුත් අද තරුණ පරම්පරාව ඊටත් වඩා වැඩි කාලයක් ස්මාට් ජංගම දුරකථන සහ ඩිජිටල් සමඟ කාලය ගත කරයි. අද බොහෝ අය බයිබලය කියවන්නේද දුරකථනයෙන්ය. අපි ඩිජිටල් ක්‍රමයට හසුවූ විට එයින් ඇතිවන විනාශය අප නොදැනම අපව විනාශයේ මාර්ගයට ගෙන යයි , අප හැමදේටම සීමාවක් තබා ගෙන දෙවියන් වහන්සේට දෙන්නා වූ වේලාවේ අප ආරක්ෂා කරන්න යුතුයි.

## (c). පාපයේ රටාව!

අප පාපොච්චාරණය නොකළ පාපයන් තිබේනම් එය දෙවියන් වහන්සේ සමග තිබෙන්නා වූ සම්බන්ධතාවයට බලවත් බාධාවක් වෙයි. *''නුමුත් නුඹලාගේ අපරාධම නුඹලා සහ දෙවියන්වහන්සේ අතරේ වෙන්වීමක් කෙළේය. උන්වහන්සේ නොඅසන ලෙස නුඹලාගේ පාපද උන්වහන්සේගේ මුහුණ නුඹලාගෙන් සැඟව්වේය." (යෙසායා 59:2)* දාවිත් මෙලෙස යාච්ඤා කළේය. *''එඩිතරව පව් කිරීමෙන් ඔබගේ මෙහෙකරුවා වැළැක්වුව මැනව; ඒවා මා කෙරෙහි අධිපතිකම් නොකෙරේවා....'' (ගීතාවලිය19:13)* අප වෙතට පැමිණෙන්නා වූ පාප පරීක්ෂාවන් ගැන අපි ඉතා අවදියෙන් සිටින්නට අවශ්‍ය වෙයි දෙවියන් වහන්සේ ඒවා අපට තේරුම් ගැනීමට බලය හා ශක්තිය දෙන පිණිස යාච්ඤා කරමු.

ECHO OF HIS CALL
Ministries 57th Year
Inaugural Convention!
Dates:
Friday, August 8th to
Sunday, August 10, 2025
ECHO OF HIS CALL
Main Church at Chepauk,
Chennai - 600 005.
Sis. Angeline Selvakumari
Assistant Pastor
Please Pray and Participate!

Posted at “Egmore RMS Patrika Channel” RNI NO. TN/SIH/2006/17846

**NOTICE**

Please store the Mobile Phone numbers (+91) 98410 71858, (+91) 98412 71858 of Pastor S. Sam Selva Raj on your mobile phones.
- Editor

## (d). ආත්මික තෙහෙට්ටුව!

අප දෙවියන් වහන්සේත් සමඟ ගත කරන කාලය අඩු නම්, අප ආත්මික දේවල් වලින් ඉතා අඩු ස්ථානයකට පැමිණ අප වෙහෙසට පත් වී කලකිරීමටත් දැවී යාමටත් පත්වෙයි. මා නිතරම දැක තිබෙන දෙයක් නම්; ආත්මික ලෙස ඉතා වේගයෙන් දුවන අය අධික ලෙස වෙහෙසට පත් වන බවයි.

අප සෑම විටම ඉතා සමබර ජීවිතයක් ගත කළ යුතුයි. අපගේ ශක්තිය විය යුත්තේ ස්වාමීන් වහන්සේ තුළ නිතරම ප්‍රීතිවීමයි. අප නිතරම උන්වහන්සේගේ අභිමුකත්වයට ගොස්; අපගේ සවිය අලුත් කරගත යුතුයි. අපගේ දර්ශනය අලුත් කරගත යුතුයි. ඔබ අතරින් යම් කෙනෙක් ආත්මික ලෙස වෙහෙසට පත් වී සිටී නම්; උන්වහන්සේගේ කැඳවීම මතක් කරගන්න.

*‘‘වෙහෙසවෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි, මා වෙතට වරෙල්ලා, මම නුඹලාට සහනයය දෙමි.” (මතෙව් 28:11)*

ප්‍රිය සහෝදරයා සහෝදරිය දෙවියන් වහන්සේ අපව කැඳවා තිබෙන්නේ ඵල දරන පිණිසයි කියා අප මෙනෙහි කළෙමු. අපි මේ ආකාරයට දෙවියන් වහන්සේ තුළ රඳා පැවතීය යුතුය. තවද උන්වහන්සේ තුළ රඳා පවතින්නේ කෙසේද කියා කියාත් ඵල දරන්නේ කෙසේද කියාත් අප බැලුවෙමු.

අපිට පැමිණෙන බාධාවන් මොනවාද කියා අප දනිමු. එසේම අපගේ ආත්මය කැමති වන නමුත් මාංශය දුර්වල බව අපි දනිමු.

අපගේ හදවත් අප සෝදිසිකර අප වර්ධනය විය යුතු තැන් මොනවාද කියා දෙවියනවහන්සේ එළිදරව් කරන්නේ කියාත් මා දෙවියන් වහන්සේගේ රාජ්‍යයේදී අධික ලෙස ඵල දරන්නෝ වෙන්නය කියාත් මා යාච්ඤා කරමි.

දෙවියන්වහන්සේ අපට ස්ව කැමැත්ත, දීමනා හා නිදහස දී තිබේ. අප මේවා පාවිච්චි කරන්නේ කෙසේද?

*************

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

Annual Subscription : Rs. 100/- Life Subscription : Rs. 2000/-

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God’s children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at “Egmore RMS Patrika Channel”**
on 2nd AUGUST 2025.
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**